ලිංගික අපරාධයන් හැඳින්වීමේදී "දූෂණය" හෝ "කෙලෙසීම" යන යෙදුම් බහුලව භාවිත වුවත්, එය යෝග්‍ය භාවිතාවක් ද යන්න Ethics Eye අපි මින් පෙර ද ප්‍රශ්න කර ඇත්තෙමු. අප එසේ ඇසීමට හේතුව වන්නේ, "දූෂණය" හෝ "කෙලෙසීම" යන යෙදුම් ඔස්සේ, ලිංගික අපරාධයකට මුහුණ පෑවෙකු අපවිත්‍ර වූ බවට අදහසක් ගම්‍ය වීමයි. ලිංගික අපරාධයන්ට ලක් වූවන් සම්බන්ධයෙන් සමාජය තුළ තවමත් පවත්නා ගහර්ාත්මක ආකල්පයන්ද සමඟින් බලන විට, එවැනි යෙදුම් ඔස්සේ ලිංගික අපරාධයන්ට ලක් වූවන් තවදුරටත් සමාජය තුළ කොන් වීමේ අවදානමක් නැති දැයි අප ප්‍රශ්න කළ යුතු වේ.

ලන්ඩනයේ දී චීන තරුණියක අපයෝජනය කිරීමේ වරදට, ශ්‍රී ලාංකික තරුණයකු හට සිර දඬුවම් නියම වීමේ පුවත දිනමිණ සහ මව්බිම පුවත් වාතර්ාවන් තුළ දැක්වුණු ආකාරය මෙහිදී අපට සලකා බැලිය හැක.

* දිනමිණ - "දූෂණය" යන්න සිරස්තලයේ සඳහන් වේ. අන්තගර්තයෙහි ද "දූෂණය" යන්න සඳහන් වේ.

* මව්බිම - සිරස්තලයේ "කෙලෙසීම" යනුවෙන් සඳහන් වේ. පුවත් අන්තගර්තය තුළ වඩාත් නිවැරදිව එය "අපයෝජනයක්" යැයි සඳහන් වේ.

ඔබ සිතන ලෙසට, "දූෂණය" හෝ "කෙලෙසීම යන යෙදුම් වෙනුවට 'ලිංගික අපරාධය' නැතිනම් 'ලිංගික අපයෝජනය' යන යෙදුම් වඩාත් යෝග්‍ය නොවන්නේ ද?

**Ethics Eye නිරීක්ෂකයෙකු වීමට ඔබත් කැමතිද? එසේ නම්, ඔබ හඳුනාගන්නා මාධ්‍ය ආචාර ධමර් කඩ කිරීම් අප වෙත එවන්න.

*අපගේ නිරීක්ෂණයන් WhatsApp ඔස්සේ නොමිලේ ලබා ගන්න! ඔබගේ නම සහ WhatsApp අංකය ඍජු පණිවිඩයක් (DM/inbox) හරහා අප වෙත එවා, දැන්ම Ethics Eye subscriber කෙනෙකු වන්න!